රුහුණ විශ්වවිද්‍යාලය

2015/2016 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 2000 ස්ථලය

දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

**SOC 22613 - සමකාලීන සමාජ සංස්ථා**

ප්‍රශ්න <u>හතරකට</u> <u>(04)</u> පමණක් පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කෙරේ.)

කාලය : පැය 03 යි.

---

01. සමාජ සංස්ථා යනු කුමක්දැ යි අර්ථ දක්වමින්, සමාජ ඒකාබද්ධතාව උදෙසා එමඟින් ඉටුවන කෘත්‍යයන් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

02. සමාජ විද්‍යාත්මක එළඹුම් ඔස්සේ පවුල් සංස්ථාව පිළිබඳ විග්‍රහයක් කරන්න.

03. එක්කෝ

(i) "ඥාතීත්වය යනු සමාජ අරමුණු සාධනය කරගැනීම සඳහා ඇති වූ භෞතික රටාවකි." පහදන්න.

නැත්නම්

(ii) විවාහයේ ලක්ෂණ හා කෘත්‍ය පැහැදිලි කර සහවාසය (Cohabitation) හා විවාහය (Marriage) යන සංකල්ප සංසන්දනය කරන්න.

04. "ප්‍රභූ සංසරණය පිළිබඳ විල්ෆ්‍රෙඩෝ පැරේටෝගේ (Wilfredo Pareto) න්‍යාය අනෙකුත් ප්‍රභූ න්‍යායයන්ට වඩා පටුවේ." විවේචනාත්මක විග්‍රහයක් කරන්න.

05. ඉන්දියාවේ කුලක්‍රමය තවදුරටත් නොනැසී පැවතීමට බලපානු ලබන හේතු සාධක පිළිබඳ විමසීමක් කරන්න.

06. අධ්‍යාපනයේ සමාජ කෘත්‍යයන් පිළිබඳ අවධානය යොමු කරමින්, ශ්‍රී ලංකාවේ වර්තමාන ද්විතියික අධ්‍යාපන ක්‍රමයේ සමාජ මෙහෙවර විවේචනාත්මක ව විග්‍රහ කරන්න.

07. "ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය අතර ඇති ජීව විද්‍යාත්මක වෙනස්කම් අභිභවනය කරමින් සමාජ වෙනස්කම් මත කාන්තාව නොතකා හැරීමක් සමාජ සංස්ථා තුළ සිදුවේ." ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආශ්‍රිත ව ප්‍රායෝගික උදාහරණ මඟින් විමසන්න.

08. ශ්‍රී ලාංකීය සමාජය තුළ ගෝලීයකරණය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ විවේචනාත්මක රචනාවක් ලියන්න.

@@@@@@@@@

126